•

# තෙරිපැහැ පාරම්පරික වෙදකමෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ

වෛද්‍ය තාරක සමන්ත ශ්‍රී

ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ වැඩ සිටි අනුනායක තෙරිපැහැ ශ්‍රී සීලවංශ ස්වාමීන් වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ අධිකරණ සංඝනායක අග්ග මහා පණ්ඩිත රාජකීය පණ්ඩිත අතිපූජ්‍ය නාපානේ ප්‍රේමසිරි කළාගම්වත්ත, මිරිස්වත්ත, ජේ.කේ.එම්. කිරිනත්තේ වෙදදුරුතුමා පුත්තලම තබ්බෝව සිසිර කුමාර ලියනාරච්චි වෙදදුරුතුමා, ගාල්ල අළුත්දෙණිය ජී.එම්. අළුත්දෙණිය වෙදදුරුතුමා ආදීන්ගෙන් සුපෝෂිත තෙරිපැහැ වෙද පරම්පරාවේ වර්තමාන වෙදදුරුතුමන් වන්නේ පාරම්පරික වෛද්‍ය කීර්තිසිංහ මුදියන්සේලාගේ ආරියවංශ කීර්තිසිංහ වෙදදුරුතුමන්ය.

සර්වාංග රෝග, සර්ප විෂ, විත පිළිකා, විෂ වෙදකම, භූත විද්‍යාව, ජ්‍යොතිෂ, යන්ත්‍ර මන්ත්‍ර, ශාන්ති කර්ම ආදී ක්ෂේත්‍ර ගණනාවක ම ප්‍රවීණයකු වන තෙරිපැහැ වෙදමහතා මෙම සියළු ක්ෂේත්‍ර ඔස්සේ ලක් වැසි ජනයාගේ රෝ දුක් සුව කිරීමට කරනු ලබන මෙහෙය පැසසිය යුත්තකි. වස විස ඉනා බෙහෙත් විත බන්ධන ශරීරගත වීමෙන් ඇතිවන පිළිකා තත්ත්ව මෙන්ම කල් ගත වූ දූෂි විෂ තත්ත්ව සඳහා යන්ත්‍ර මන්ත්‍ර භූත විද්‍යා ශාස්ත්‍රයන් යොදා ගනිමින් අවශ්‍යතාවය පරිදි පිත් විරේක, විෂ විරේක, ළය විරේක, ඇස් විරේක, කන් විරේක, නිය විරේක මගින් ප්‍රතිකාර කිරීම මෙම වෛද්‍ය කර්මයේ විශේෂිත ලක්ෂණයකි. කාලාන්තරයක් තිස්සේ පවතින තුන් දොස් කිපීමෙන් ඇති වන විෂ තත්ත්ව සඳහා මෙමගින් සාර්ථක ව ප්‍රතිකාර කළ හැක. යන්ත්‍ර මන්ත්‍ර යොදා ගනිමින් කරනු ලබන මෙවැනි ප්‍රතිකාරවල දී හෙණරාජ තෛලය, තෛයෝරු තෛලය, මහා අංගම්රාජ තෛලය, මහා යක්ෂ භූත තෛලය, ඉරුදාපන තෛලය, රාජ තරංගනී තෛලය ආදී විශිෂ්ඨ තෙල් වර්ග යොදා ගැනීමද විශේෂ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක. රෝග රෝගී පරීක්ෂාවේ දී නාඩි මගින් විෂ බැලීම, තැඹිලි ගෙඩියෙන් විෂ පරීක්ෂා කිරීම, පහන් දැල්ලෙන් විෂ පරීක්ෂා කිරීම ආදී විශේෂිත ක්‍රමවේදයන් අනුගමනය කිරීම මෙම ප්‍රතිකාර ක්‍රමවේදයන්හි සුවිශේෂ ලක්ෂණ ලෙස හඳුනා ගත හැක. උන්මාද, අපස්මාර, අර්ශස් ආදී රෝග සඳහා මෙන්ම මත්පැන් එපා කරවීමටත් ගොවිතැන් ආරක්ෂා කිරීමටත් විවිධ වශීකර්ම සඳහාත් යන්ත්‍ර මන්ත්‍ර ප්‍රමුඛ විශිෂ්ඨ ප්‍රතිකාර ක්‍රමයක් මෙම පරම්පරාව සතුව පවතී.

සූදුරු - මහදුරු - කළුදුරු - අසමෝදගම් - තිප්පිලි - කරාබුනැටි - එනසාල් - වසාවාසි - සාදික්කා - කුරුඳු - එරඬු මුල් - මුරුංගා මුල් - තිත්ත තිබ්බටු මුල් - අමු ඉඟුරු - යක් නාරං මුල් - කංසා මල් සහිත දළු - වලඟසාල් - දේවදාර - කරපිංචා නැටි - සියඹලා නැටි - සීනක්කාරං - සහිඳ ලුණු යන ඖෂධ කලං එක බැගින් ගෙන එයට ශුද්ධ ජයපාල මදටිය 20 ක් දමා වතුර පත 4, තැඹිලි වතුර පත 01, කෝමාරිකා මද පත 01, සියඹලා  යුෂ පත 01, කළු උක් යුෂ පත 01 මිශ්‍ර කර පත 8,  1 ට සිඳ පෙරා නවකුණ්ඩරාජ මන්ත්‍රයෙන් 108 වරක් මතුරා පිත් ගිනි සංහාර ඉදිරෙට්ටු මන්ත්‍රයෙන් 108 වරක් ජීවම් කර සවසට අමු ඉඟුරු යුෂ මේස හැඳි 02 කට සීනි මී පැණි ස්වල්පයක් මිශ්‍ර කර දීම විත පිළිකා ගෙඩි ඉතා සාර්ථක ව සුව කළ හැකි ඉතා ප්‍රත්‍යක්ෂ ඖෂධයක් ලෙස මෙම පරම්පරාවේ ප්‍රතිකාර අතර දක්නට ලැබේ.

සූර්ය පුටයෙන් සිඳින ලද නැඹුල් ගස්වල රන් තැඹිලි තෙල්, තැඹිලි තෙල්, නවසි තැඹිලි තෙල් මෙන්ම දිවි තෙල්, වලස් තෙල්, ගජමුතු තෙල්, කීන තෙල් ආදිය ද තනිකර සුදු රතු කළු එළදෙනුන්ගේ ගිතෙල් වර්ග ද ප්‍රතිකාර සඳහා භාවිත කිරීම තෙරිපැහැ වෛද්‍ය ක්‍රමයේ සුවිශේෂි ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය.

ඊට අමතර ව නැකැත් යෝග අනුව ලබා ගත් නුග, බෙලි, දෙහි, දෙළුම්, කටුපිල යන ශාක වර්ග වල පිළිල වල පිටි ද කළු කොහිල අල පිටි, බෙරලිය පිටි, නැඹුල් වළඳේ උරච්චි කර ගත් පිටි විශේෂ ද ප්‍රතිකාරය සඳහා භාවිත කිරීම විශේෂයෙන් දක්නට ලැබේ. කංසා, කස්තුරි, සාදිලිංගම්, රසදිය, මනෝශීල ආදී ඖෂධ වර්ග ද ශෝධනය කර ප්‍රතිකාර සඳහා භාවිත කිරීම තෙරිපැහැ වෛද්‍ය ක්‍රමයේ දක්නට ලැබේ.

යන්ත්‍ර මන්ත්‍ර චිකිත්සාවේ දී රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා නවගුණ යන්ත්‍රය, රතන යන්ත්‍රය, සීවලී යන්ත්‍රය, ත්‍රිවිධ රත්නත්‍රය යන්ත්‍රය, ඥානවරම් යන්ත්‍රය, අභිසම්ධාන යන්ත්‍රය, ශනි මෘත්‍යුංජය යන්ත්‍රය, මහා විශ්ණු අඝෝර යන්ත්‍රය, නවග්‍රහ අඝෝර යන්ත්‍රය ආදිය ද භාවිත කරයි.

ලක්වාසී වෙදදුරන්ගේ දැනුම අවබෝධය ඇති කිරීමටත් ඥානාලෝකය දල්වීමටත් දැනුම බෙදාදීමේ අරමුණින් තෙරිපැහැ ආරියවංශ වෙදදුරු විසින් පල කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව 20කට අධිකය. ඒ අතර ජීවක ඖෂධ වට්ටෝරු සංග්‍රහය, සාරධර්මාවලිය, ශාස්ත්‍රාවලිය, භූතලෝකය, ගෙවතු ආරක්ෂක ක්‍රම, මන්ත්‍ර මාලා, මීවැල්ලෑවේ බෝධි වන්දනාව, වලාහක බන්ධනය, ජල නන්දන බන්ධනය, භූතයන් බැඳගෙන වැඩ ගන්නා ක්‍රම, නාග පිල්ලුව, කලම් දහ අට, සංසර්ගයට රහස්‍ය ඖෂධ, හිත් බැඳීමේ ක්‍රම, කොඩි වින බැලීමේ ක්‍රම, රන් සැපත, සමන් මලේ අපේ හඬ යන ග්‍රන්ථ විශිෂ්ට ස්ථානයක් ගනී.